ඉහත VI හා VII යටතේ ක්‍රියාකිරීමේ දී විදුහල්පතිවරයා විසින් පාසල් විනය මණ්ඩලය කැඳවා එමගින් සිදුකරනු ලබන නිසි පරීක්ෂණයකින් පසුව ගනු ලබන තීරණයක් මත පමණක් එසේ ක්‍රියා කළ යුතු ය.

VIII. පාසලේ විනය මණ්ඩලය විසින් ඉතා බරපතල විනය විරෝධී ක්‍රියාවක් සිදුකර ඇති බව තීරණය කරනු ලැබූ අවස්ථාවක දී එම ක්‍රියාවේ ස්වභාවය හා බරපතලකම අනුව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ හෝ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ පූර්ව අනුමැතිය ඇති ව සති 02කට වැඩි කාලයක් පංති තහනම් කිරීම හෝ ළමයා වෙනත් පාසලක ඉගෙනුම ලබමින් සිටි ශ්‍රේණියට ම මාරු කිරීම.

සිසුන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමේදී ඒ පිළිබඳ වාර්තා ලේඛනගත කළයුතු අතර ඒවා පරීක්ෂාකාරීව විදුහලේ තබා ගැනීමට කටයුතු කළ යුතු යි.

තවද VII හා VIII හි සඳහන් ක්‍රියාමර්ග ගැනීමේදී විදුහල්පති විසින් ඒ පිළිබඳ ලොග් සටහනක් ද තැබිය යුතු යි. ඉහත සඳහන් පරිදි සිසුන්ගේ මනා හැසිරීම් රටාව ඇති කරලීමේ අරමුණින් ගනු ලබන ක්‍රියා මාර්ග විදුහලේ ප්‍රධාන රැස්වීම හෝ දැන්වීම් පුවරු ආදිය මගින් පාසල තුළ ප්‍රසිද්ධ නොකිරීමට වග බලාගත යුතුයි.

2.3 පාසල් විනය පවත්වාගෙන යාමේ අරමුණින් වුව ද සිසුන්ට දඬුවම් දීම සිදුකළ හොත් පහත සඳහන් නීති ක්‍රියාමාර්ගවලට මුහුණදීමට සිදුවනු ඇත.

I. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ iii වන පරිච්ඡේදයේ 11 වන වගන්තිය හා xvi වන පරිච්ඡේදයේ 126 වැනි වගන්තිය අනුව මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමේ නඩු නිමිත්තක් උද්ගත විය හැකි ය.

II. 1995 අංක 22 දරණ දණ්ඩ නීති සංග්‍රහයේ (සංශෝධන) පනතේ 3 වන වගන්තියේ හා ප්‍රධාන ප්‍රඥප්තියේ 308 (අ) වගන්තිය යටතේ ළමයින් කෲරත්වයට භාජනය කිරීමේ වරද යටතේ නඩු නිමිත්තක් උද්ගත විය හැකි ය.

III. අධ්‍යාපන අමාත්‍යාංශයේ බලධරයන් විසින් පවත්වනු ලබන විනය පරීක්ෂණවලින් ශාරීරික දඬුවම් ලබාදී ඇති බව ඔප්පු වුවහොත් ආයතන සංග්‍රහයේ 11 වන කාණ්ඩය අනුව විනය ක්‍රියාමාර්ග ගනු ලැබිය හැකි ය.

## 3.00 ළමා අපහරණය

3.1 ළමා වියට නොගැළපෙන විවිධ නොනිසි ක්‍රියා සඳහා ළමයින් යොදවා ගැනීම ළමා අපහරණය ලෙස සරල ව හැඳින්විය හැකි ය. ශ්‍රී ලංකාව තුළ වසර ගණනක සිට ළමා අපහරණ සිද්ධීන් ඉතා සීඝ්‍රයෙන් වැඩි වී ඇති අතර වර්තමානයේ විවිධ ආකාරයේ ළමා අපහරණ සිද්ධීන් රාශියක් දිනපතා වාර්තා වන තත්ත්වයකට පත්ව ඇත.

පාසල තුළ ද ළමා අපහරණ සිදුවීම් වාර්තාවීම ඉතා ම කණගාටුදායක තත්වයකි. පාසලේ දී ළමයාගේ සුරක්ෂිතභාවය සහතික කළයුතු විදුහල්පති, ගුරු හා අනෙකුත් කාර්යමණ්ඩල තුළින් ළමයාට අකටයුතුකම් සිදුවීම වඩාත්ම ඛේදනීය තත්ත්වයකි.